# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 අගෝස්තු

### මානවශාස්ත්‍ර පීඨය

### සාහිත්‍ය විචාරය

**පුනරුද යුගයේ අවසානයේ සිට දහඅට වන සියවස තෙක් බටහිර සමාජ සංස්කෘතික හා දාර්ශනික පරිස්ථිතිය හඳුනාගැනීම LTCR 28214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. දහසය - දහනම වන (16-19) ශතවර්ෂයන්හි යුරෝපයෙහි උද්ගත සමාජ, දේශපාලන සහ ආර්ථික විපර්යාස අරභයා සමාලෝචනයක් සපයන්න.

02. ''ප්‍රංශ විප්ලවය වනාහී දරාගත නොහෙන ඒකාධිපති පාලනයකට එරෙහි ව ගොඩනැගුණු අරගලයකි.''මෙහි නිරවද්‍යතාව සසාධක ව පහදන්න.

03. නව සම්භාව්‍ය යුගයේ මහා බ්‍රිතාන්‍යයෙහි සමාජ දේශපාලන සන්දර්භය පිළිබඳ ඔබගේ නිරීක්ෂණ ඉදිරිපත් කරන්න.

04. ඔබට අභිමත මාතෘකා දෙකක් පිළිබඳ ව කෙටි සටහන් සපයන්න.

    1. මේරි වොල්ස්ටොන්ක්‍රාෆ්ට්
    2. දෙවන චාර්ල්ස් රජ
    3. විග් සහ ටෝරි පාක්ෂිකයන් අතර පවත්නා ප්‍රතිවිරෝධතා
    4. යුරෝපීය බුද්ධ ප්‍රබෝධය අබියස ආචීර්ණ කල්පික මතවාද කෙරෙහි ඇතිවූ විරෝධය නිර්මාණ සාහිත්‍යයෙහි ගැබ්ව ඇති ආකාරය
    5. ජෝන් ඩ්‍රයිඩන්ගේ විචාර භූමිකාව
    6. සැමුවෙල් ජොන්සන්

05. කාව්‍යය, කවියා සහ විචාරකයා යන ත්‍රිත්වය අතර පවත්නා සමවාය සම්බන්ධතාව අරභයා ඇලෙක්සැන්ඩර් පෝප් විසින් ප්‍රකාශිත අදහස් සමාලෝචනය කරන්න.

06. ''සත්පුරුෂයා සහ අහිංසකයා කෘතියෙහි පැනෙන ආඛ්‍යාන රීතිය ප්‍රබල ලෙස පාඨකයා ආකර්ෂණය කරයි.'' විමසන්න.

07. ''මරණය නියත ධර්මතාවකි, යන්න සුසාන කාව්‍යයෙහි (Elegy written in a country churchyard) මුඛ්‍ය තේමාවයි.'' සනිදර්ශනව විභාග කරන්න.

08. ''ඉපැරණි ඉංග්‍රීසි ගම්මානය හා එයට අනන්‍ය පුරුෂාර්ථ ගිලිහී යාමෙන් කවියාගේ සිත්හි නිපන් සංවේගයෙහි කාව්‍යාත්මක ප්‍රකාශනයක් ලෙස පාළුගම හැඳින්විය හැකිය.'' අභිමත නිදර්ශන ආශ්‍රයෙන් පහදන්න.

09. අධිරාජ්‍යයකු ස්වකීය ජනයා සහ රට වෙනුවෙන් වග කියන සැටි, උපහාසාත්මක දෘෂ්ටියකින් නිරූපණය කිරීමෙහි ලා ගලිවර්ගේ චාරිකා කෘතියෙහි රචකයා දැක්වූ නිර්මාණාත්මක කෞශල්‍යය අගයන්න.

10. ''රොබින්සන් කෘසෝ **(Robinson Crusoe)** නවකතාවෙහි කතා නායක භූමිකාව, නිශ්චිතව ම තත්කාලීන ඉංග්‍රීසි සමාජය විසින් ඇගයීමට පාත්‍රිත නව්‍ය පුරුෂාර්ථ පද්ධතිය පිළිබිඹු කරයි.'' තත් ප්‍රකාශයෙහි සත්‍යාසත්‍යතාව සනිදර්ශන ව පරීක්ෂා කරන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගිනි)

***********************************